# මිළඟ පාර්ලිමේන්තුව කුමක් සඳහා විය යුතු ද - V

1956 මැතිවරණය දින තුනක් තිස්සේ පැවැත්විණි. ඒ අප්‍රියෙල් 5, 7 සහ 10 දිනවල ය. 1971 අප්‍රියෙල් 5 වැනි දා අයාලේ ගිය පනස්හයේ දරුවෝ සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මියගේ ආණ්ඩුවට ද රාජ්‍යයට ද විරුද්ධ ව ආයුධ අතට ගත්හ. 1956 මෙන් ම 1971 ද අප්‍රියෙල් මාසයේ පළමු දින දහයේ දී මෙරට ඉතිහාසයේ සන්ධිස්ථාන සනිටුහන් විය.. 2005 අප්‍රියෙල් මාසයේ ද පළමු දින දහයේ ද රටේ සන්ධිස්ථානයක් සනිටුහන් වනු ඇත. 1956 ගැන හොඳම විග්‍රහය කර ඇත්තේ ගුණදාස අමරසේකර මහතා ය. ඒ අහම්බයක්වත් හදිසියේ හටගත් කැරැල්ලක්වත් නොවන බව පෙන්වාදුන් ඒ මහතා පනස්හය යනු අනගාරික ධර්මපාලතුමාගේ ව්‍යාපාරය නැවත මතුවීමක් බව පැහැදිලි කෙළේ ය. අද අපි පනස්හය ගැන තවත් දේ දනිමු. යටත්විජිත විරෝධී අරගලයේ ජයග්‍රාහී සන්ධිස්ථානයක් ලෙස අපි ඒ හඳුනමු. සිංහලයන්ට විශේෂයෙන් ම සිංහල බෞද්ධයනට අහිමි වී තිබූ තැන යළි දිනාගැනීමේ එක් පියවරක් 1956 දී ගැණිනි. එහෙත් 1956 දී අපේ පියවරුන්ට සියල්ල ඉටුකරගැනීමට නො හැකි විය. අපට එසේ බලාපොරොත්තු විය හැකි ද නො වේ. 1956න් අප ඉගෙන ගත් පාඩම් බොහෝ ය. අපට දිනාගැනීමට තවත් බොහෝ දේ ඇත.

1989 අවුරුද්දේ ශ්‍රී ල නි පක්ෂය අතරමං වී සිටියේ ය. 1977 සිට ම විරුද්ධ පක්ෂයේ සිටි ශ්‍රී ල නි පක්ෂයට ඉදිරියක් නො පෙණිනි. 1987 කුප්‍රකට ඉන්දු ලංකා ගිවිසුම අත්සන් කර තිබිණි. ජ වි පෙ නැවතත් රාජ්‍යයට විරුද්ධව ආයුධ ගත් අරගලයක යෙදී සිටියේ ය. ඒ 1971 ට වඩා අමානුෂික විය. වෛරී දේශපාලනය ඉස්මත්තට ම පැමිණ තිබිණි. ජාතිකත්වය හා මාක්ස්වාදය අතර දෝලනය වෙමින් පැවති ජ වි පෙට යටත්විජිත විරෝධී අරගලය හා ජාතිකත්වය එක්කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව කිසිදු අවබෝධයක් නො වී ය. බොහෝ දෙනකුට යටත්විජිත විරෝධය මාක්ස්වාදය මත පමණක් රැඳී තිබූ ප්‍රපංචයක් විය. මාක්ස්වාදය හා ජාතිකත්වය එකතුකිරීම ඇතැමුන්ගේ අපේක්ෂාව විය. ගුණදාස අමරසේකර මහතා මාක්ස්වාදයේ හා ජාතිකත්වයේ සහවාසයක් ගැන අනගාරික ධර්මපාල මාක්ස්වාදී ද යන කෘතියෙන් කතා කෙළේ ය. පසුව ඒ මහතා පළකළ විශිෂ්ට කෘති දෙකක් වූ අසත්‍ය කතාවක් හා ප්‍රේමයේ සත්‍ය කතාව පදනම් වී ඇත්තේ ඒ එක්කිරීමේ තේමාව මත ය. මේ එක්කිරීම ගැන මට පැහැදීමක් නො තිබුණි. මම මාක්ස්වාදියකු ව සිටි කාලයේ දීත් පසුවත් ඒ නොපෑහෙන්නක් ලෙස දුටුවෙමි. මාක්ස්වාදියකු ව සිටි කාලයේ මාක්ස්වාදය මත පදනම් ව ඒ එක්කිරීමට ඉතා පැහැදිලිව ම විරුද්ධ විමේ හැකියාව මා සතු වූ නමුත් ජාතික්තව මගට පිවිසීමෙන් පසුව මුල් කාලයේ දී  එයට පැහැදිලි විරෝධයක් සූත්‍රගත කිරීමට නොහැකි විය. එහෙත් මාක්ස්වාදය ජාතිකත්වයට කිසිසේත්ම අවශෝෂණය කළ නොහැකි බව මට දැණිනි. ඒ දැනුමකට වඩා දැනීමක් විය. පසුව චින්තනය යන සංකල්පයේ වර්ධනයත් සමග එය දැනුමක් බවට පත්විය. අමරසේකර මහතා ජාතිකත්වය හා මාක්ස්වාදය එකතුකිරීමට කතාකෙළේ ද හැඟීමෙන් බව මෙහි ලා සඳහන් කරන්නේ ඒ මහතාට අගෞරවයක් කිරීම සඳහා නො වේ.

1989 දී ශ්‍රී ල නි ප විවිධ පරයේෂණ කරමින් සිටියේ ය. චන්ද්‍රිකා කුමාරතුංග මහජන පක්ෂයේ බහුජන පක්ෂයේ හා වෙනත් පෙරමුණුවල කටයුතු කෙළේ සිංහලත්වයට (ජාතිකත්වයට එරෙහිව ය). ඇය සිය සැමියා සමග වෙන්නායි හි කොටි තිප්පළුවලට ගියා ය. ජ වි පෙ භීෂණය මැද වුව ද ජාතිකත්වයට බර ව සිටියේ ය. එකල ශ්‍රී ල නි පක්ෂයට නව මාවතක් සොයමින් සිටි නායකයන් අතර මහින්ද රාජපක්ෂ මහතා කැපී පෙනිණි. පළමු වරට බණ්ඩාරනායක අනුස්මරණ දේශනයක් පැවැත්වීමට 1989 දී ශ්‍රි ල නි ප තීරණය කෙළේ ය. ඒ අනුස්මරණ කමිටුවේ සභාපති වූයේ මහින්ද රාජපක්ෂ මහතා ය. එස් බී දිසානායක මහතා ද ඒ කමිටුවේ විය. එකල ශ්‍රී ල නි පක්ෂයේ ලේකම් වූයේ ජේ ආර් පී සූරියප්පෙරුම මහතා ය. අමරසේකර මහතා අනගාරික ධර්මපාල මාක්ස්වාදී ද කෘතියට ඒ නම තබා ඇත්තේ සූරියප්පෙරුම මහතා අබුද්දස්ස යුගයක් කියවා එසේ ප්‍රශ්න කිරීමෙන් පසුව ය. මාක්ස්වාදය හා ජාතිකත්වය අතර වූ ප්‍රශ්නය අවුරුදු විසි එකක් පමණ සුළු කාලයකට පෙර ද විසඳී නොතිබීම ඉන් පැහැදිලි වෙයි.

1984 පමණ කාලයේ කොළඹ විශ්වවිද්‍යාලයේ ගවේෂකයෝ නමින් සංවිධානයක් බිහිවිණි. එහි මූලික අරමුණ වූයේ විවිධ කරුණු පිළිබඳ ගවේෂණය කිරීම ය. බටහිර විද්‍යාව පිළිබඳ ප්‍රශ්නය, දැනුමේ සාපේක්ෂකත්වය, මාක්ස්වාදය, පරිසරය රැකීම, දෙමළ ජාතිවාදය, ඉතිහාසය, සාහිත්‍යය, ගොවිකම, වෙදකම ආදී විවිධ මාතෘකා ඔස්සේ ශිෂ්‍යයෝ මා සමග සාකච්ඡා කළහ. 1986 දී මගේ ලෝකය කෘතිය පළවිය. එකල කොළඹ විශ්වවිද්‍යාලයේ මෙන් ම වෙනත් විශ්වවිද්‍යාලවල ද ගවේෂකයෝ සංවිධානය ගැන දැන සිටියෝ වූහ. අද ඒ ඇතැම්හු දේශපාලන ලෝකයේ විවිධ පක්ෂවල ක්‍රියාකරති. 1987 දී පමණ චින්තන පර්ෂදය බිහිවූයේ එක්තරා අයුරකින් ගතහොත් “ගවේෂකයෝ” පුළුල් වීමෙනි. 1987 දී චින්තන පර්ෂදය විසින් කලින් විද්‍යාලංකාර පිරිවෙන මගින් පළකළ

© Prof. Nalin De Silva

කාලය ප්‍රකාශනය නැවත පළකිරීම ආරම්භ කරන ලදී. කාලය සඟරාව මුල සිට ම ප්‍රභාකරන් හා කොට්ටි සංවිධානය පරාජය කළ යුතු ය යන මතයේ පදනම් ව ඊළාම් මතවාදයට එරෙහිව සටන් කෙළේ ය. ගවේෂකයන් ගැන අභිමානයෙන් කිවයුතු කරුණක් වෙයි. එයට සම්බන්ධ වී සිටි කිසිවකුවත් අද ඔවුන් දේශපාලන ප්‍රේක්ෂාවලියේ කිනම් තැනක ස්ථානගත වුවත් ජාතික මතවාදවලින් වෙනත් මතවාදයකට ගිය බවක් දැනගන්නට නැත. පශ්චාත්නූතනවාදී හා මංගල සමරවීර කෙටි කාලීන උප්පරවැට්ටිවලට කාලයක් ආකර්ශණය වුවෝ ද අද වන විට නැවතත් ජාතික මතවාදවලට පැමිණ ඒ මතවාද තම නිර්මාණ ලෙස පෙන්වති. අනෙක් අතට එකල ජාතිකත්ව මතවාදවලට විරුද්ධව සිටි ඇතැම් ශිෂ්‍යයෝ අද ඒ මතවාද දරති.

1989 සැප්තැම්බරයේ එක් සැඳෑවක මහින්ද රාජපක්ෂ මහතා සහ එස් බී දිසානායක මහතා අප නිවසට පැමිණ පළමු බණ්ඩාරනායක දේශනය පැවැත්වීමට මට ආරාධනය කිරීම දෛවෝපගත සිද්ධියක් විය. සූරියප්පෙරුම මහතා මගෙන් මාතෘකාව කුමක් දැයි විමසූ කළ මා දුන් පිළිතුර වූයේ පනස්හයේ දරුවෝ යන්න ය. ජාතිකත්වයේ පක්ෂය වූ ශ්‍රී ල නි පක්ෂය ජාතික මතවාදවලට ආකර්ෂණය වෙමින් සිටියේ ය. අමරසේකර මහතාට අනුව නම් ඒ පක්ෂය හිස නැති කවන්ධයක් විය. ඇත්තට ම එහි හිසට විවිධ ලිබරල්වාදී හා මාක්ස්වාදී මතවාද රිංගවා තිබිණි. අවශ්‍ය වූයේ තොවිලයක් කර ඒ මතවාද පළවා හැරීම ය. එහෙත් තොවිලය පහසු කාර්යයක් නො වී ය. චන්ද්‍රිකා පක්ෂයට ගෙන්වා ගත්තවුනට පැහැදිලි දර්ශනයක් විය. ඒ ජාතික මතවාදවලට පක්ෂයේ වැට කඩුළු බැඳීමත් චන්ද්‍රිකා ලවා පක්ෂය සහසන්ධීය රාජ්‍ය මතවාදයට ගෙනයෑමත් ය. පෘතුගීසීන් දෝන කතිරිනා යොදාගත් ආකාරයෙන් චන්ද්‍රිකා යොදාගැනීමට බ්‍රිතානීන්ට අවශ්‍ය විය. කොණප්පු බණ්ඩාර ළමිස්සියක වූ දෝන කතිරිනා ග්‍රහණයට ගෙන රජකමට පත්වී පෘතුගීසීන්ගේ උපාය බිඳ දැමී ය. චන්ද්‍රිකා ළමිස්සියක නොවූවා ය. ඇය ග්‍රහණයට ගැනීම පහසු කාර්යයක් නො වී ය. එසේ නම් කළ යුතුව තිබුණේ ඇය ශ්‍රී ල නි ප අභ්‍යන්තරයෙහි ම පරාජය කිරීම ය. ඒ සඳහා සුදුස්සා වූයේ මහින්ද රාජපක්ෂ මහතා ය. සුප්‍රසිද්ධ පා ගමනින් ඇරඹි අරගලය කෙළවර වූයේ රාජපක්ෂ මහතා පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා බවට පත්වීමෙනි. ඉතා සියුම්ව ක්‍රියාකරමින් තම ජාතිකත්ව මතය වුවමනාවට වඩා ප්‍රසිද්ධ නොකර උපක්‍රමශීලීව කටයුතු කළ රාජපක්ෂ මහතා 2005 න් පසුව පක්ෂයෙහි තම බලය තහවුරු කරගෙන ඇත. චන්ද්‍රිකා බටහිරයන්ට ලැදිව පක්ෂ විරෝධී ප්‍රතිපත්ති අනුගමනය කිරීමෙන් බණ්ඩාරනායකවරුන් දේශපාලනයෙන් පිටමං කර ඇත. එයට ප්‍රධාන වරදකරුවා ඇය ම ය. 1951 දී බණ්ඩාරනායක මහතා සමග විපක්ෂයට ගිය ඩී ඒ රාජපක්ෂ මහතාගේ මහින්ද පුතණුවන්ට ජාතිකත්වයේ හා යටත්විජිත විරෝධී අරගලයේ ධජය හිමි වී ඇත.

එහෙත් මෙහි දී අපට තවත් පියකු සහ පුතකු ගැන කතාකිරීමට සිදුවෙයි. පිලිප් ගුණවර්ධන මහතා මෙරට මාක්ස්වාදයේ පියා ලෙස හැඳින්වෙයි. එහෙත් බොරළුගොඩ සිංහයා යන විරුදාවලිය ලත් ඒ මහතා පසුව පැරණි පාර්ලිමේන්තුවේ මාක්ස්වාදී පොතපත පුස්කා ඇතැයි සිංහනාද කෙළේ ය. අපි එකල ඒ මහතා විවේචනය කෙළෙමු. එහෙත් පසුව මාක්ස්වාදයෙන් තොරව යටත්විජිත විරෝධී අරගලයක් ඇති බව අපි තේරුම් ගත්තෙමු. ජාතිකත්වය යනු මේ යුගයේ යටත්විජිත විරෝධී අරහලය හා බැඳී ඇති බව අපට අවබෝධ විය. අපට ක්‍රමයෙන් ඒ පිළිබඳ සංකල්ප හා ප්‍රවාද ඇතිවිය. ජාතිකත්වයෙන් තොර යටත්විජිත විරෝධයක් හෝ යටත්විජිත විරෝධයෙන් තොර ජාතිකත්වයක් හෝ මේ යුගයේ නැත. එපමණක් නොව යටත්විජිතවාදයෙන් මුළුමණින් ම මිදීමට නම් අප බටහිර දැනුම් ආධිපත්‍යයෙන් මිදිය යුතු බව අපේ නිගමනය විය. ජාතිකවාදී මතයක සිට කොට්ටි පරාජය කළ යුතු බව ප්‍රසිද්ධියේ කී පළමු දේශපාලනඥයා දිනේශ් ගුණවර්ධන මහතා විය. දෙමළ ජාතිවාදයට එරෙහිව දිගින් දිගට ම ප්‍රසිද්ධියේ පෙනී සිටියේත් ජාතික සංවර්ධනයක් ගැන මුල සිට ම කතාකෙළේත් ඒ මහතා ය. මිළඟ පාර්ලිමේන්තුවේ දිශානතිය තීරණය කිරීමේ දී ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට දිනේශ් ගුණවර්ධන මහතා විශාල ශක්තියක් වනු ඇත. මිළඟ පාර්ලිමේන්තුව ශක්තිමත් ආණ්ඩුවක් බිහිකරනු ඇති අතර මෙරට අනාගතයට බලපාන අණපණත් රාශියක් ම සම්මත කරගත යුතු ය. නව ව්‍යවස්ථාවකට අමළර ව අපේ ම වූ සංවර්ධනයක් ඇතිකිරීමත් අපේ දරු මුණුබුරන් ඊනියා වැදගත් මිනිසුන් බවට පත්කරනවා වෙනුවට ගුණධර්මවලින් පිරුණු ජාතිකත්වයෙන් ඔදවැඩුණු පුරවැසියන් කරගැනුමටත් අවශ්‍ය පියවර ගැනීමට පාර්ලිමේන්තුවට භාරවනු ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva